

# අපි හැමෝම ලස්සනයි



H.M.විහිනි දිනුල්යා වැල්ලගිරිය



# අපි හැමෝම ලස්සනයි



එච්.එම්.විහිනි දිනුල්යා වැල්ලගිරිය

අපි හැමෝම ලස්සනයි

කර්තෘ ප්‍රකාශනයකි.

පළමුවන මුද්‍රණය 2023 ඔක්තෝම්බර් 15

ISBN 978-624-206-775-9

Bar Code 9 786242 06

කතාව සහ චිත්‍ර
එච්.එම්.විහිනි දිනුල්යා වැල්ලගිරිය
2 වසර B
මහමායා බාලිකා විදුහල
මහනුවර

# පිදුම

හිමි දෙය

අහිමි දෙය මැද

සතුටෙන් දුකෙන්

දුකෙන් සතුටෙන්

කෙමෙන් දිවියට ළං වෙමින්

දිවි ගෙවන ආදරණීය

මගේ චුටි යාලුවන්

හැමෝමටම

සෙනෙහසින් පිදෙන

තිළිණයකි.



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැංවීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතාව හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය පොතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවන් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් **"දිවිය දිනන විද්‍යුත් පොතක්"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතේට එකතු වන වටිනාකම

සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොත් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි .

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි වේග ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියටද ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු .

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලයේ ගුරුභවතුන්, දෙමාපියන්, ආදිශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට ස්තුතියි මෙමගින් පිරිනමමි .


සසිකලා සේනාධීර,<br>
විදුහල්පතිනි,<br>
මහමායා බාලිකා විද්‍යාලය,<br>
මහනුවර.<br>
2023.11.01

ළමා සාහිත්‍ය කටයුතුවලදී දිවි දීමෙන් ළමා ලොව සුරැකීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන මහනුවර මහමායා බාලිකා විදුහල හා ගුරු මණ්ඩලයට ගෞරවනීය ස්තුතිය පළමුව පුදකරමි.

H.M.විහිනි දිනුල්යා වැල්ලගිරිය වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි බලාපොරොත්තු වෙමි.

කර්තෘ එච්.එම්.විහිනි දිනුල්යා වැල්ලගිරිය
ස්ථිර ලිපිනය
අංක 160, තලාතුඔය පාර,
අම්පිටිය,
මහනුවර
දුරකථන අංකය 077-4270214

එකමත් එක කැලයක ලස්සන සමනල  අම්මෙක් චූටි බිත්තරයක් දැම්මා. හැබැයි මේ සමනල අම්මා ගොඩක් බඩගින්නේ තමයි හිටියේ. ඒ නිසා මේ සමනල අම්මා මල් පැණි බොන්න මල්වත්තකට පියඹා ගියා.



සමනල අම්මා ගිය අතරේ මේ කැලයට මහ වැස්සක් ඇද හැලුනා. ඉතින් වැස්ස නිසා මේ බිත්තරේ තිබුණ තැනින් ගහගෙන ගියා.

සමනල අම්මාට ගොඩක් දුකයි. එයා මහ වැස්සේම අඬ අඬා බිත්තරය හෙව්වා. ඒත් බිත්තරය හම්බුණේ නෑ.



ඉතින් මේ ගහගෙන ගියපු බිත්තරය ගලක් ඇතුළේ හිර වුණා. ටික දවසකට පස්සෙ මේ බිත්තරේ කැඩිලා චූටි දළඹු බබෙක් ඉපදුණා.



ඉතින් දළඹු බබා ගොඩක් අමාරුවෙන් එළියට ආවා. මුළු දවසම තනියම ඉන්න දළඹු බබාට ටිකක් කම්මැලි නිසා

එයාගෙ තනි මකන්න යාළුවෙක් හොයාගන්න හිතුණා. ඉතින් එයා කැලේ ඇවිද ඇවිද යාලුවෙක් හොයන්න හිතුවා.

මේ අතරින් පුංචි තාරා බබෙක් සෙල්ලම් කරමින් ඉන්නවා දළඹු බබා දැක්කා. ඉතින් දළඹු බබාටත් සෙල්ලම් කරන්න ආසා හිතුණා.

දළඹු බබා තාරා බබාගෙන්

සෙල්ලම් කරන්න ඇහුවා.

දළඹු බබා ඔයා හරිම කැතයි

ඔයා යකෙක් වගේ කියලා විහිළු කළා.



චූටි දළඹු බබාට  දුක හිතුණා. ඉතින් තනියම අඬ අඬා අලුත් යාළුවෙක් හොයා ගන්න ඇවිද්දා.



එතකොට එයා දැක්කා චූටි කුකුළු පැටියාව. කුකුළු පැටියා හරිම සතුටින් සෙල්ලම් කරමින් සිටියා.




දළඹු බබා දුවගෙන ගිහින් කුකුල් පැටියාගෙන් මෙහෙම ඇහුවා.

“යාලුවේ යාලුවේ මං ඔයත් එක්ක සෙල්ලම් කරන්න එන්නද?

කුකුල් පැටියා දළඹු බබා දිහා අකමැත්තෙන් බැලුවා.

අපෝ............ ඊයා.......... ඔයා හරි කැතයිනේ. මට නම් බෑ ඔයා එක්ක සෙල්ලම් කරන්න.



මෙහෙම කියපු කුකුල් පැටියා දළඹු බබාට ආඩම්බරයෙන් ගියා.

කුකුල් පැටියා යන අතරතුර එයාට වෘකයෙක් හම්බුණා.

කුකුල් පැටියා බයවෙලා හයියෙන් අඬන්න ගත්තා.

"අනේ මාව බේරගන්න" කියලා කුකුල් පැටියා ඇඬුවා.

දුකින් හිටපු දළඹු බබාට ඒ හඬ ඇහුණා. එයා ඉක්මනින් කුකුල් පැටියා හිටපු තැනට ආවා. චූටි මොළෙන් හිතලා මේ දළඹු බබා එයාගේ විෂ සහිත බූව වෘකයාගේ මුළු ඇඟේම ගෑවා. වෘකයා අමාරුවෙන් ඇඟ කසන්න ගත්තා. එතකොට එයාගේ කකුල ලිස්සලා එතන තිබුණු උගුලකට අහුවුණා.



කුකුල් පැටියා දළඹු බබාට ගොඩක් ස්තූති කළා.

මේ සිදුවීම එක සුරංගනාවියක් දිව්‍යලෝකේ ඉඳලා බලා හිටියා. ඒ සුරංගනාවිය මේ දළඹු බබා ගොඩක් ලස්සන වෙන්න කියලා ලස්සන ප්‍රාර්ථනාවක් කරා. ඉතින් එයා මේ ලෝකෙට ඇවිත් එයා එයාගෙ මැජික් බලෙන් දළඹු බබාගේ යහපත්කම දැකලා එයාව ගොඩක් ලස්සන කළා.



දැන් දළඹු බබාට ලස්සන තටු දෙකක් හා ලස්සන රූපයක් ලැබුණා. දැන් මෙයා දළඹු බබා නෙවෙයි. එයා දැන් හිත හොඳ සමනලි කියලයි කැලේ අය හඳුන්වන්නේ.

සුරංගනාවී කැලේ හැම බබෙක්ටම කිසිම කෙනෙක්ට දුක හිතෙන විදියට හැසිරෙන්න, බනින්න, කතා කරන්න එපා කියලා අවවාද කළා. ඉතින් අපිත් මේ වගේ අපේ හැම යාළුවෙක්ටම ආදරෙන් ඉමු .





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනය හේතුකොටගෙන පොතපතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අතෙකින් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාව ශාස්ත්‍රීය වගකීම් ප්‍රදර්ශනාගාරයේ කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජාත්‍යන්තරයට ඩිජිටල් වේදිකාවට පිවිස හත්පතු අංකුර බවට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතීන් නිර්මාපක<br>
2023.11.01